(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 36.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2009 ඔක්තෝබර් මස 22 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0112/'09

1.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මධ්‍යම පළාත් සභා මැතිවරණයට අදාළව ස්වාධීන රූපවාහිනියේ දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින්ගේ දැන්වීම් ප්‍රචාරය කළ බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම් ඒ ඒ පක්ෂයේ නම හා පක්ෂය වෙනුවෙන් කුමන ආයතනයක, කුමන පුද්ගලයකු මුදල් ගෙවා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) තවදුරටත් මුදල් ගෙවීමට නියමිතව ඇති බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) මෙම මැතිවරණයට අදාළව කවර පක්ෂවලින්, කවර අපේක්ෂකයින් දැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළේද;

(ii) එසේ ඉල්ලා සිටි සියලු අයට ගුවන් කාලය වෙන් කළේද;

(iii) ඒ කවර පදනමක් යටතේද;

(iv) මුදල් ගෙවා හෝ මුදල් ගෙවීමට ගිවිසගෙන දැන්වීම් ප්‍රචාරය කළ අපේක්ෂකයින්ගේ නම්, ලිපිනයන්, ගෙවූ මුදල හා ගෙවීමට ඇති මුදල කොපමණද;

(v) මෙම මැතිවරණයට අදාලව ගිවිසගත් පරිදි මුදල් ගෙවීම පැහැරහැර ඇති පුද්ගලයින්, පක්ෂ හෝ ආයතන කවරේද;

(vi) එම ආයතනවලින් මුදල් අයකර ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0223/'09

2.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "මාතර සංවර්ධන අරමුදල" නමින් අරමුදලක් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූයේද;

(ii) එසේනම්, එය ආරම්භ කළේ කවදාද;

(iii) එම අරමුදල ක්‍රියාත්මක වූ කාල පරිච්ඡේදය තුළ ධීවර අමාත්‍යධුරය දරන ලද්දේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අරමුදලට අදාළ බැංකුව හා බැංකු ගිණුම් අංකය කවරේද;

(ii) එම අරමුදලට මුදල් ලැබුණු මූලාශ්‍රයන් කවරේද;

(iii) අරමුදල් ලෙස ලැබුණු ප්‍රමාණය කොපමණද;

(iv) එම අරමුදලේ මුදල් යොදවා තිබෙන්නේ කවර කටයුතු සඳහාද;

(v) ඒ කොපමණ මුදල් ප්‍රමාණයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0419/'09

3.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) පල්ලෙපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ග වල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණ කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0513/'09

4.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ගා/තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 35 ඉඩමේ මේ වන විට කොපමණ පිරිසක් අනවසරයෙන් පදිංචිව සිටීද;

(ii) එම පදිංචිකරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) ඔවුන් කොපමණ කාලයක සිට එම ඉඩමේ පදිංචිව සිටීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ගම්මානයට මාර්ග පහසුකම් සහ විදුලි බලය ලබා දී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ඇ) දීර්ඝ කාලයක සිට මෙම පදිංචිකරුවන් නිවාස සාදාගෙන, වගා කටයුතු කරගෙන සිටින බැවින් කොපමණ කාල සීමාවක් තුළ ඔවුන්ට එම ඉඩම් සඳහා ඔප්පු ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0543/'09

5.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) ජාත්‍යන්තර කම්කරු සංවිධානය මගින් ප්‍රකාශ කරන ආකාරයට 2009 පළමු කාර්තුව තුළ ශ්‍රී ලංකාවේ විවිධ ආර්ථික ක්ෂේත්‍රයන්හි රැකියා 192,000 ක් අහිමිවී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) නොඑසේ නම්, එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවේ විවිධ ආර්ථික ක්ෂේත්‍රයන්හි රැකියා කොපමණ සංඛ්‍යාවක් අහිමි වී තිබේද;

(ii) එසේ රැකියා අහිමිවූවන්ගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් රජය මේ වනවිට ලබා දී තිබෙන සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0549/'09

6.

ගරු එල්. ජී. වසන්ත පියතිස්ස මහතා,— අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) හිඟුරාණ සීනි ආයතනය ප්‍රථම වරට පෞද්ගලීකරණය කළේ කවදාද;

(ii) ඒ කවර පුද්ගලයෙකුට හෝ ආයතනයකටද;

(iii) එහි තක්සේරු වටිනාකම හා විකුණුම් මිල කොපමණද;

(iv) ලබාගත් අය අදාළ සම්පූර්ණ මුදල ගෙව්වේද;

(v) නොඑසේ නම්, ගෙවූ මුළු මුදල කොපමණද;

(vi) ගෙවූ වාර ගණන හා ඒ කවර ආකාරයටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විකුණුම් අවස්ථාවේදී සමස්ත සේවක සංඛ්‍යාව හා එය ස්ථිර, අනියම්, කොන්ත්‍රාත් කම්කරුවන් ලෙස වෙන වෙනම කවරේද;

(ii) වන්දි ගෙවා ඉවත්කළ සංඛ්‍යාව, එක් අයෙකු ලැබූ අවම හා උපරිම වන්දි මුදල සහ එය තීරණය කළ ක්‍රමවේදය කවරේද;

(iii) වන්දි ලබාගත් අයට නැවත ආයතනයට බැඳිය හැකිනම් එම සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0710/'09

7.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) මේ දක්වා ඡන්දයෙන් තෝරා පත්කර ගන්නා ලද / පත් කරනු ලැබූ විධායක ජනාධිපතිවරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් පාලනය කළ කාල සීමාව කොපමණද;

(iii) හිටපු ජනාධිපතිවරු එකිනෙකා වෙනුවෙන් හෝ ඔවුන් නම් කරන ලද පුද්ගලයින් වෙනුවෙන් හෝ වැය කළ සම්පූර්ණ වියදම සහ එම දරන ලද වියදමට හේතු, වෙන් වෙන්ව කවරේද;

(iv) ඔවුන්ගෙන් කවර පුද්ගලයෙකුට නිවාස හෝ ඉඩම් ලබාදී තිබේද;

(v) එසේ නම්, ඒවා පිහිටි ස්ථාන සහ ඒවායේ ප්‍රමාණයන් කොපමණද;

(vi) ඒවා ලබා දුන්නේ කුළී පදනම මතද නොඑසේ නම්, පූර්ණ අයිතියට යටත්වද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඔවුන්ට ලබා දී ඇති මුළු ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0114/'09

8.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශය යටතේ කලාප අංක 02 යටතට ගැනෙන කොළඹ, ගම්පහ, කළුතර හා යාපනය දිස්ත්‍රික්කයන් හි සමාජ සුභසාධන ව්‍යාපෘති වෙනුවෙන් 2006, 2007, 2008 සහ 2009 යන වර්ෂ සඳහා වෙන වෙනම කොපමණ මුදලක් වෙන් කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතීන් හි වැඩ අවසන් කර ඇත්නම්, වැඩ ආරම්භ කළ දිනය, වැඩ අවසන් කළ දිනය, ඇස්තමේන්තුගත මුදල හා ගෙවා ඇති මුළු මුදල කොපමණද යන්න වෙන වෙනම එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2009 වර්ෂය සඳහා තෝරාගෙන ඇති ව්‍යාපෘති හා ඇස්තමේන්තුගත මුදල වෙන වෙනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0479/'09

9.

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දෙවිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, මාතර - කතරගම ප්‍රධාන මාර්ගය හා සම්බන්ධ කපුගම පුරන් වූ වෙල්යායේ කොටසක් ගොඩ කර හෝටලයක් ඉදිකර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කපුගම පුරන් වූ වෙල්යායේ කොටසක් ගොඩ කිරීමට අවසර ලබා දුන්නේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

(iii) පුරන් වූ වෙල්යායන් ගොඩ කිරීමට අවසරදීම මහින්ද චින්තනයේ ප්‍රතිපත්තිවලට අනනුකූල නොවන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් කළ භූමියේ හා හෝටලයේ හිමිකරුගේ නම හා ලිපිනය කවරේද;

(ii) එම ගොඩකිරීම හා හෝටලය ඉදිකිරීම නීති විරෝධී නම් ඊට එරෙහිව පියවර ගන්නේද;

(iii) එසේනම්, ඒ කවර කාලයක් තුළ ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

0629/'09

10.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහරගම, යහම්පත් මාවත, අංක 80/11 හි පදිංචි ඩබ්. එම්. ලක්ෂ්මන් නමැති අය 1987.11.02 වැනි දින ආරක්ෂක නියාමකයෙකු ලෙස ත්‍රිකුණාමලය වරායේ සේවයට බැඳුනු බවත්;

(ii) 1997.07.28 වැනි දින සිට සේවය අතහැර ගියාසේ සලකා ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් මොහුගේ සේවය නතර කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) 1997.07.25 වැනි දින හෝ ආසන්න දිනයකදී සර්පයෙකු දෂ්ඨ කිරීම නිසා දැඩි ලෙස රෝගාතුර වූ මොහු ප්‍රතිකාර ලබාගත් ආයුර්වේද විෂ වෛද්‍යවරයෙකුගේ වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කර තිබියදීත් සේවය අතහැර ගියාසේ සැලකුවේ කවර හේතුවක් නිසාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඔහු ඉදිරිපත් කර ඇති අභියාචනය නැවත සැලකිල්ලට ගෙන නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0633/'09

11.

ගරු එල්. ජී. වසන්ත පියතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ ඒ පොලිස් ස්ථාන සතුව ඇති (පාවිච්චි කළ හැකි) ජීප් රථ, ට්‍රක් රථ හා මෝටර් සයිකල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් පොලිස් ස්ථානය සඳහා 2009 වසරේ මුල් මාස 6 තුළ ඉන්ධන සඳහා ලබාදුන් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2008 වසරේ මුල් මාස 6 සඳහා එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0634/'09

12.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ක්වේට් වන්දි ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් අංක S-08098 යටතේ ගාල්ලේ, චන්ද්‍රලතා වික්‍රමතිලක මහත්මිය ඉල්ලුම් කර ඇති දිනය කවරේද;

(ආ) (i) පාර්ලිමේන්තු උපදේශක කාරක සභා යෝජනා අංක 0375 යටතේ මවිසින් ඉදිරිපත් කළ යෝජනාවට පිළිතුරු වශයෙන්, 1994.12.31 දක්වා ඇති වන්දි සඳහා ලියාපදිංචි වීමට අවසර ලබාදී තිබූ බවට සඳහන් කළ බවත්;

(ii) KCTR 21651 දරන සමීක්ෂණ තොරතුරු අංකය අනුව 2003 වසරේ ඇය වන්දි සඳහා ඉල්ලුම්කර ඇති බව සහ 2003.12.17 දින නැවත පරීක්ෂාකර ඇති බව කු/ වන්/ගෙ/ස/2000 රිසිට් පත අනුව පැහැදිලි වන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) අදාළ උපදේශක කාරක සභා වාර්තාවට අනුව මා වෙත දන්වා සිටියේ 2004 ට පෙර ලියාපදිංචි වී නොමැති බව වුවද, ඉහත තොරතුරු අනුව 2004 ට පෙර අදාල ලිපි ලේඛන ලබාදී ලියාපදිංචි වී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) චන්ද්‍රලතා වික්‍රමතිලක මහත්මියට ගෙවීමට නියමිත කුවේට් වන්දි මුදල් කොපමණ කාලයක් තුල ලබා දෙන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0712/'09

13.

ගරු රවි කරුණානායක මහතා,— කෘෂිකර්ම සංවර්ධන සහා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වාර්ෂික පදනම මත සහ "කන්න" පදනම මත පසුගිය අවුරුදු දහය තුළ දී —

(i) යල සහ මහ "කන්න" වලදී නෙලා ගන්නා ලද වී අස්වනු ප්‍රමාණය කොපමණද;

(ii) නිෂ්පාදන වියදම කොපමණද;

(iii) රජය විසින් සහතික කරන ලද සාමාන්‍ය මිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය අවුරුදු 4 තුළ මාසික සහ වාර්ෂික පදනම මත —

(i) සහල් අවශ්‍යතාවය කුමක්ද;

(ii) සහල් ආනයනය මත පනවන ලද බදු ප්‍රමාණයන් කොපමණද;

(iii) වී වගා කිරීම සඳහා ලබා දෙන ලද පොහොර සහනාධාර සඳහා වියදම් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) පසුගිය අවුරුදු පහ තුළ දිස්ත්‍රික් පදනම මත අවශ්‍ය වූ පොහොර මෙට්‍රික් ටොන් ප්‍රමාණය එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0465/’09

14.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගෘහස්ත විදුලි පාරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) කර්මාන්ත හා වෙළෙඳ ව්‍යාපාර සඳහා විදුලිය ලබාගන්නා සංඛ්‍යාව කොපමණද;

(iii) 2008 හා 2009 වර්ෂවල වෙන වෙනම අනුරාධපුර දිස්ත්‍රික්කයේ කොපමණ ගෘහස්ථ විදුලි පාරිභෝගිකයින් සංඛ්‍යාවකගේ විදුලිය විසන්ධි කරන ලද්දේද;

(iv) 2008 හා 2009 වර්ෂවල අනුරාධපුර දිස්ත්‍රික්කයේ කර්මාන්ත හා වෙළෙඳ ව්‍යාපාර කොපමණ සංඛ්‍යාවක වෙන වෙනම විදුලිය විසන්ධි කර තිබේද;

(v) 2008 හා 2009 වර්ෂයන්හිදී විදුලිය විසන්ධි කිරීමෙන් ගෘහස්ත විදුලි පාරිභෝගිකයන්ගෙන් දඩ මුදල් ලෙස කොපමණ මුදලක් අයකරගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදුලිය විසන්ධි කරන පදනම කවරේද;

(ii) විදුලිය විසන්ධි කිරීමට පෙර අදාළ පාරිභෝගිකයින් දැනුවත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0635/’09

15.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,—දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද කොමසාරිස් තනතුර ඇතුළු ප්‍රධාන පරිපාලන තනතුරු සඳහා තිබිය යුතු සුදුසුකම් කවරේද යන්න, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එම තනතුරු සඳහා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ දැනට සේවය කරන වෛද්‍යවරුන් කොපමණ සංඛ්‍යාවක් සුදුසුකම් ලබා සිටීද;

(ii) ඔවුන්ගේ නම් හා දැනට සේවය කරන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දේශීය වෛද්‍ය ක්‍රමය සම්බන්ධව අවබෝධයක් සහිත නිලධාරීන්ගෙන්, දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල පරිපාලන තනතුරු සම්පූර්ණ කිරීමට පියවර ගන්නේද;

(ii) දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් තනතුර හැර, අනෙකුත් ප්‍රධාන තනතුරු අමාත්‍යාංශයේ සේවය කරන සුදුසුකම් ලැබූ වෛද්‍යවරුන්ගෙන් සම්පූර්ණ කිරීමට කවර කාල සීමාවක් තුළ අවශ්‍ය කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේදී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම පැවැත්වෙන කාලවේලා පූ. භා. 9.30 සිට අ. භා. 4.30 දක්වා විය යුතුය. අ. භා. 12.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009.05.26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2009.10.23 වැනි දින රැස්වීම පැවැත්වෙන කාලවේලා පූ. භා. 9.30 සිට අ. භා. 3.30 දක්වා විය යුතුය. අ. භා. 12.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

කැළෑ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*2.

පතල් හා ඛණිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*3.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*9.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*10.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*12.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*13.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*14.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*15.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*16.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

මැතිවරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*21.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*22.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*23.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ වූ නියෝග,— 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 26 වගන්තිය සමග කියවිය යුතු 212 වගන්තිය යටතේ යම් පුද්ගලයෙකු යම් කාර්තුවක් සඳහා ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්ද සම්බන්ධයෙන් වැඩ බලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 ජූනි මස 19 දිනැති අංක 1606/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2009.10.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ වූ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 ජූනි මස 30 වැනි දිනැති අංක 1608/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.10.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දුම්කොළ බදු පනත යටතේ වූ නියෝග,— 1999 අංක 08 දරන දුම්කොළ බදු පනතේ 21 වැනි වගන්තිය යටතේ සිගරැට්, සුරුට්ටු, බීඩි හෝ පයිප්ප දුම්කොළ සඳහා වූ අමුද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන් වැඩබලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 ජූලි මස 17 වැනි දිනැති අංක 1610/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.10. 08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*27.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විමසා සාදන ලදුව, 2009 සැප්තැම්බර් මස 03 වැනි දිනැති අංක 1617/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2009.10.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*28.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— පාංශු සංරක්ෂණ පනත යටතේ නියෝග,— (450 වැනි අධිකාරය වූ) 1951 අංක 25 දරන පාංශු සංරක්ෂණ පනතේ 4 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදන ලදුව, පාංශු සංරක්ෂණ පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා වන 2009.10.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*29.

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යතුමා,— සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත යටතේ නියෝගය,— 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනතේ 11 වැනි වගන්තිය යටතේ කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යතුමා විසින් සාදනු ලැබ, 2009 මැයි මස 19 දින, අංක 1602/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.08.26 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*30.

ප්‍රවාහන අමාත්‍යතුමා,— ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ නියෝගය,— 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 46 (ඌ) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 44 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යතුමා විසින් පනවන ලදුව 2009 මැයි මස 29 දිනැති අංක 1603/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.09.10 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*31.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*32.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*33.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*34.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*35.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*36.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*37.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*38.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ අතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*39.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

40.
දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

41.
උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

42.
පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

43.
මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

44.
බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

45.
සම් හාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0120/'09

1.
ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බස්නාහිර පළාත් සභා මැතිවරණයට අදාළව ජාතික රූපවාහිනියේ දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින්ගේ දැන්වීම් ප්‍රචාරය කළ බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම් ඒ ඒ පක්ෂයේ නම හා පක්ෂය වෙනුවෙන් කුමන ආයතනයක, කුමන පුද්ගලයකු මුදල් ගෙවා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) තවදුරටත් මුදල් ගෙවීමට නියමිතව ඇති බවට එතුමා දන්නෙහිද?

(ඈ) (i) මෙම මැතිවරණයට අදාළව කවර පක්ෂවලින් කවර අපේක්ෂකයින් දැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළේද;

(ii) එසේ ඉල්ලා සිටි සියලු අයට ගුවන් කාලය වෙන් කළේද;

(iii) ඒ කවර පදනමක් යටතේද;

(iv) මුදල් ගෙවා හෝ මුදල් ගෙවීමට ගිවිසගෙන දැන්වීම් ප්‍රචාරය කළ අපේක්ෂකයින්ගේ නම්, ලිපිනයන්, ගෙවූ මුදල, ගෙවීමට ඇති මුදල කොපමණද;

(v) මෙම මැතිවරණයට අදාලව ගිවිසගත් පිරිදි මුදල් ගෙවීම පැහැරහැර ඇති පුද්ගලයින්, පක්ෂ හෝ ආයතන කවරේද;

(vi) එම ආයතනවලින් මුදල් අයකර ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0121/'09

2.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බස්නාහිර පළාත් සභා මැතිවරණයට අදාළව ස්වාධීන රූපවාහිනියේ දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින්ගේ දැන්වීම් ප්‍රචාරය කළ බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම් ඒ ඒ පක්ෂයේ නම හා පක්ෂය වෙනුවෙන් කුමන ආයතනයක, කුමන පුද්ගලයකු මුදල් ගෙවා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) තවදුරටත් මුදල් ගෙවීමට නියමිතව ඇති බවට එතුමා දන්නෙහිද?

(ඈ) (i) මෙම මැතිවරණයට අදාළව කවර පක්ෂවලින් කවර අපේක්ෂකයින් දැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළේද;

(ii) එසේ ඉල්ලා සිටි සියලු අයට ගුවන් කාලය වෙන් කළේද;

(iii) ඒ කවර පදනමක් යටතේද;

(iv) මුදල් ගෙවා හෝ මුදල් ගෙවීමට ගිවිසගෙන දැන්වීම් ප්‍රචාරය කළ අපේක්ෂකයින්ගේ නම්, ලිපිනයන්, ගෙවූ මුදල, ගෙවීමට ඇති මුදල කොපමණද;

(v) මෙම මැතිවරණයට අදාළව ගිවිසගත් පරිදි මුදල් ගෙවීම පැහැරහැර ඇති පුද්ගලයින්, පක්ෂ හෝ ආයතනය කවරේද;

(vi) එම ආයතනවලින් මුදල් අයකර ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0122/'09

3.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වයඹ පළාත් සභා මැතිවරණයට අදාළව ස්වාධීන රූපවාහිනියේ දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින්ගේ දැන්වීම් ප්‍රචාරය කළ බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම් ඒ ඒ පක්ෂයේ නම හා පක්ෂය වෙනුවෙන් කුමන ආයතනයක, කුමන පුද්ගලයකු මුදල් ගෙවා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) තවදුරටත් මුදල් ගෙවීමට නියමිතව ඇති බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) මෙම මැතිවරණයට අදාළව කවර පක්ෂවලින් කවර අපේක්ෂකයින් දැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළේද;

(ii) එසේ ඉල්ලා සිටි සියලු අයට ගුවන් කාලය වෙන් කළේද;

(iii) ඒ කවර පදනමක් යටතේද;

(iv) මුදල් ගෙවා හෝ මුදල් ගෙවීමට ගිවිසගෙන දැන්වීම් ප්‍රචාරය කළ අපේක්ෂකයින්ගේ නම්, ලිපිනයන්, ගෙවූ මුදල, ගෙවීමට ඇති මුදල කොපමණද;

(v) මෙම මැතිවරණයට අදාළව ගිවිසගත් පරිදි මුදල් ගෙවීම පැහැරහැර ඇති පුද්ගලයින්, පක්ෂ හෝ ආයතන කවරේද;

(vi) එම ආයතනවලින් මුදල් අයකර ගැනීමට කවර ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0124/'09

4.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වයඹ පළාත් සභා මැතිවරණයට අදාළව ජාතික රූපවාහිනියේ දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින්ගේ දැන්වීම් ප්‍රචාරය කළ බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඒ ඒ පක්ෂයේ නම හා පක්ෂය වෙනුවෙන් කුමන ආයතනයක, කුමන පුද්ගලයකු මුදල් ගෙවා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) තවදුරටත් මුදල් ගෙවීමට නියමිතව ඇති බවට එතුමා දන්නෙහිද?

(ඈ) (i) මෙම මැතිවරණයට අදාළව කවර පක්ෂවලින් කවර අපේක්ෂකයින් දැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළේද;

(ii) එසේ ඉල්ලා සිටි සියලු අයට ගුවන් කාලය වෙන් කළේද;

(iii) ඒ කවර පදනමක් යටතේද;

(iv) මුදල් ගෙවා හෝ මුදල් ගෙවීමට ගිවිසගෙන දැන්වීම් ප්‍රචාරය කළ අපේක්ෂකයින්ගේ නම්, ලිපිනයන්, ගෙවූ මුදල, ගෙවීමට ඇති මුදල කොපමණද;

(v) මෙම මැතිවරණයට අදාළව ගිවිසගත් පරිදි මුදල් ගෙවීම පැහැරහැර ඇති පුද්ගලයින්, පක්ෂ හෝ ආයතනය කවරේද;

(vi) එම ආයතනවලින් මුදල් අයකර ගැනීමට කවර ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0130/'09

5.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මධ්‍යම පළාත් සභා මැතිවරණයට අදාළව ජාතික රූපවාහිනියේ දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින්ගේ දැන්වීම් ප්‍රචාරය කළ බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඒ ඒ පක්ෂයේ නම හා පක්ෂය වෙනුවෙන් කුමන ආයතනයක, කුමන පුද්ගලයකු මුදල් ගෙවා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) තවදුරටත් මුදල් ගෙවීමට නියමිතව ඇති බවට එතුමා දන්නෙහිද?

(ඈ) (i) මෙම මැතිවරණයට අදාළව කවර පක්ෂවලින් කවර අපේක්ෂකයින් දැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළේද;

(ii) එසේ ඉල්ලා සිටි සියලු අයට ගුවන් කාලය වෙන් කළේද;

(iii) ඒ කවර පදනමක් යටතේද;

(iv) මුදල් ගෙවා හෝ මුදල් ගෙවීමට ගිවිසගෙන දැන්වීම් ප්‍රචාරය කළ අපේක්ෂකයින්ගේ නම්, ලිපිනයන්, ගෙවූ මුදල, ගෙවීමට ඇති මුදල කොපමණද;

(v) මෙම මැතිවරණයට අදාළව ගිවිසගත් පරිදි මුදල් ගෙවීම පැහැරහැර ඇති පුද්ගලයින්, පක්ෂ හෝ ආයතනය කවරේද;

(vi) එම ආයතනවලින් මුදල් අයකර ගැනීමට කවර ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0420/'09

6.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාඋල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0421/'09

7.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලග්ගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0422/'09

8.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0423/'09

9.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අඹන්ගඟ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0424/'09

10.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යටවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0425/'09

11.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උකුවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0426/'09

12.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0427/'09

13.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0428/'09

14\.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම නගර සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම නගර සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0429/'09

15\.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගලේවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

16.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මාර්ග කවරේද;

(ii) ඒවායේ නම් සහ දුර ප්‍රමාණ කොපමණද;

(iii) 2006 වර්ෂයේ මෙම ප්‍රදේශීය සභාව පත්වන විට ඉහත මාර්ගවල කොන්ක්‍රීට් අතුරා හෝ තාර අතුරා සකස් කර තිබූ දුර ප්‍රමාණය කොපමණද;

(iv) 2006 වර්ෂයේ මෙම ප්‍රාදේශීය සභාව පත්වූවාට පසුව 2008 දෙසැම්බර් දක්වා කොන්ක්‍රීට් අතුරා පිළිසකර කළ පාරවල් කවරේද;

(v) ඒවායේ දුර ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(vii) මෙම මුදල් වැය කළේ කවර වැය ශීර්ෂයකින්ද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?